// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශේෂ
අංක 1924/6 - 2015 ජූලි මස 20 වැනි සඳුදා - 2015.07.20
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012.

### 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 30 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද අමරවීර,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2015, ජූලි මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2011 නොවැම්බර් මස 2 වන දින අංක 1730/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2011 කෘතිම උපස්ථර මත වගා කරන මුහුදු ජලජ ජීවීන් අපනයන කිරීමේ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම නියෝගවල 4 වන නියෝගයේ ''රුපියල් සියයක (රු.100) ගාස්තුවක්'' යන වචන වෙනුවට ''රුපියල් පනහක (රු.50/) ගාස්තුවක්'' යන වචන ආදේශ කරනු ලැබේ ; සහ

(2) එම නියෝගවල I වන උපලේඛනයේ ''(මෙම ඉල්ලුම් පත්‍රය සමග එක් එක් උපස්ථරයක් සඳහා රුපියල් සියයක ගාස්තුවක් ගෙවිය යුතු ය.)'' යන වචන වෙනුවට ''(මෙම ඉල්ලුම් පත්‍රය සමග එක් එක් උපස්ථරයක් සඳහා රුපියල් පනහක (රු.50/) ගාස්තුවක් ගෙවිය යුතු ය.)'' යන වචන ආදේශ කරනු ලැබේ.

08 - 42

1A - PG 2555 — 1006 (2015/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.